# <u>ලෝක ආයුර්වේද දිනයට සමගාමීව කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය මඟින් පවත්වනු ලබන විවාද තරගාවලිය</u>

***“Ayurveda for People and Planet”***

## <u>නීති රීති සහ මාර්ගෝපදේශ මාලාව.</u>

1. තරඟාවලිය සඳහා සහභාගිවිය හැක්කේ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ 2025.09.14 වන දිනට ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණි. පීඨයේ ඕනෑම වෘත්තිකයක හෝ වර්‍ෂයක ඉගෙනුම ලබන අයෙකුට ඒ සඳහා සහභාගිවිය හැකිය.
2. සෑම කණ්ඩායමක්ම සාමාජිකයන් පස් දෙනෙකුගෙන් (කණ්ඩායම් සාමාජිකයන්-04, අතිරේක සාමාජිකයකු ගෙන්) සමන්විත විය යුතුය
3. එක් සිසුවෙකුට හෝ සිසුවියකට නියෝජනය කල හැක්කේ එක් කණ්ඩායමක් පමණි.
4. එක් කණ්ඩායමක් එකම අධ්‍යයන වර්‍ෂයක හෝ විවිධ අධ්‍යයන වර්‍ෂවල සිසු සිසුවියන්ගෙන් සමන්විත විය හැක.
5. සියලුම කණ්ඩායම් අයදුම් කිරීම සඳහා පහත දැක්වෙන ගූගල් ෆෝරම පුරවා අයදුම්පතක් 2025.09.14 දින ප.ව 3.00 ට පෙර යොමු කල යුතුය. තවද ඉහත අයදුම්පත්‍රයේ තම කණ්ඩායම හඳුනාගැනීම සඳහා සුදුසු කණ්ඩායම් නාමයක් (වචන 3ට නොවැඩි) සඳහන් කළ යුතුය.
   අයදුම් කිරීම සඳහා : https://docs.google.com/forms/d/e/1FAIpQLSfDxehUUF8O5x9-Wl1NmvN7r2cVciKph_4P4QtPNE69ItGzVg/viewform?usp=header
6. මාධ්‍ය- සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විය යුතුය. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන් සඳහා වෙන් වෙන් වූ තරඟාවලියන් තුනක් පැවැත්වේ.
7. පසුව පවත්වන සම්පාදක රැස්වීමේදී මාතෘකාව යෝජක ප්‍රතියෝජකතාවය ලබා දෙයි.

8. තරඟාවලිය පිළිමළුන් පිටුදැකීමේ ක්‍රමයට (knockout) පැවැත්වෙන අතර අවශ්‍ය අවස්ථාවලදී විනිශ්චය මණ්ඩලයේ තීරණය මත දක්ෂතම පරාජිතයන් තරඟාවලියේ ඉදිරි වටයන් සඳහා එක් කර ගනු ලැබේ.
9. කණ්ඩායම් සංඛ්‍යාව අනුව තරග වටය පැවැත්වෙන දිනය හා ආකාරය තීරණය කෙරේ.
10. මූලික වට වලදී සෑම විවාදකයකුටම විනාඩි 03ක කථන කාලයක් ලැබෙන අතර, නායකයින්ගේ පිලිතුරු කථාවට විනාඩි 04 ක කාලයක් ලැබේ.
11. ලකුණු ලබාදීම දිවයිනේ ප්‍රචලිත පොදු ලකුණු ලබාදීමේ ක්‍රමය අනුව සිදු කෙරේ.
12. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
13. ශූරතාව දිනන කණ්ඩායමට හා  අනු ශූරතාව දිනන කණ්ඩායමට ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමෙයි. තරඟයේ දක්ෂතම විවාදකයා හා තරඟාවලියේ දක්ෂතම විවාදකයා ද තෝරාගැනේ.


<u>සකසන ලද්දේ:</u>

<u>ආයුර්වේද දින විවාද තරඟාවලිය - සංවිධායක මණ්ඩලය</u>

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය  පේෂලා  කාරියවසම් -  075 677 8101
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය පී. ඒ. එස්. එන්. සිල්වා - 077 265 3123
- වෛද්‍ය එස්.එම්.එම්.ඩී. කීර්තිසිංහ  - 070 392 1142
- වෛද්‍ය ඩබ්ලිව්.ඒ.එච්. නිර්මලි- 077 271 3906